තනු හා සංගීත් සංකලනː
අග්‍රගණ්‍ය වයලින් වාද්‍ය විශාරද
ප්‍රවීන් රසදේව!

අම්මාගේ තුන්මාසේ පින්කම ඉවරවෙලා නංගි ඇගේ සැමියාත් එක්ක ආපහු යන්නයි සූදානම. ජයසේකරගෙන් මිලට අරන් තුරුළු කරගෙන හිටිය වයලීනය ඇය අත තියද්දි දෑස් බොඳ වුණා අද වගේ ම. උගුර හිරවුණා වචන පිටවෙන්නෙ නැතිව ම. තාත්තාගේ අඩි පාරේ ගිය නංගි සංගීතාචාර්යවරියක්. ඇය වයලීනයෙන් වැඩක් ගත්තාවේ. දෙමව්පියන් වෙනුවෙන් හැම දෙයක් ම දන් දෙන්න ලැබෙන එකත් එක අතකට බලාගෙන යනකොට පෙර පිනක්. මව්බිමේ දාලා එන්න තවත් මොනවත් ඉතිරි වෙලා නැති තරම්. පහුවදාම කොළඹ ගියේ ඕස්ට්‍රේලියානු තානාපති කාර්යාලයට යන්නත් එක්ක.

සුදු පවුලේ ඔපෙරා රිද්මය දන්නෙ ම නැතිව ඉහළ ගිහින්. ඒ රිද්මයට දෝ සුළඟත් වේගවත්. එක දවසක් ඇතුළත ඍතු හතර ම වුණත් පෙන්නන්න හපන් "මෙල්බන් අහස" යට තියෙන "මවුන්ට් වේවර්ලි" කඩමණ්ඩියේ මේපල් ගහ කොළවලට එයින් මිදෙන්න බෑ. අහස සැරසෙන්නේ වැස්සකට. වසන්තයට වැස්සක්...!

"මවුන්ට් වේවර්ලි" ඉරිදා පොළ අහවර කරන වෙලාවත් ඇවිත්. මේපල් පත් සිලි සිලියට එක් වෙන වැහි පොද සිරි සිරියත් එක්ක ම සුදු වාද්‍ය වෘන්දය එක්වන ම නැවතුම් තිතකට. ඒ, ඒ වාදනය ඉවර කරන හැටි වෙන්න ඇති. වරුවකටත් වැඩි කාලයක් තිස්සේ විඳින්න විතරක් නෙවෙයි, විඳවන්නත් එක්ක මවලා දුන්න වින්දනය වෙනුවෙන් ඩොලර් පනහක් වයලින් බහාලුමට.

"වෙල් ඩන් මේට්...!" ඒ ඔවුන්ගේ උත්සාහයට.

"චියර්ස්...!" එක එල්ලයේම යොමු වුණ යෞවනියගේ කාන්තිමත් නිල් දෑසේ මඳහසින් අහස පුරාවට විදුලි එළියක්!